**ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම**
**ஓரியண்டல் ஸ்டடிஸ் சொசைட்டி**
**THE ORIENTAL STUDIES SOCIETY OF SRI LANKA**

වෙබ් අඩවිය:இணையதளம்: **Website : www.oriental.lk**
විද්‍යුත් ලිපිනය:மின்னஞ்சல் : **Email : contact@oriental.lk**

**අධ්‍යාපන අමාත්‍යාංශය**
ඉසුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
**கல்வி அமைச்சகம்,**
இசுருபாயா, பட்டாரமுல்லா, இலங்கை.
**Ministry Of Education,**
Isurupaya, Battaramulle, Sri Lanka.


| | | |
|---|---|---|
| මගේ අංකය:<br>எனது பரிந்துரை : ප්‍රාභා.ස.කා/ස/2020-2023<br>My Referral : | ඔබේ අංකය:<br>உங்கள் பரிந்துரை:<br>Your Referral: | දිනය:<br>தேதி: 2020.02.19<br>Date: |

ගෞරවාර්හ කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්ස /
පරිවේණාධිපති ස්වාමීන් වහන්ස,

**ප්‍රාචීන ප්‍රාරම්භ, මධ්‍යම හා පණ්ඩිත උපාධි අවසාන පරීක්ෂණ විභාග පටිපාටියේ සංශෝධන**

2020 පෙබරවාරි 18 දින රැස්වූ ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ කාරක සභාව මගින් ප්‍රාචීන විභාග පටිපාටියේ පහත දැක්වෙන සංශෝධන කිරීමට තීරණය කරන ලදි. ප්‍රාචීන විභාග සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් දිරිමත් කිරීම හා ප්‍රාචීන විභාග කෙරෙහි වඩාත් උනන්දු කරවීම අරමුණු කොට කරන ලද එම සංශෝධන මෙවර විභාගයේ 2019 (2020) පටන් ක්‍රියාත්මක කිරීමට ද තීරණය කරන ලදි. මේ පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

**02. ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය හා ඊට අදාළ සංශෝධන**

ප්‍රධාන විෂයත්‍රය සඳහා එක්වර පෙනී සිට සමත් විය යුතු ය. යම් හෙයකින් නියමිත ප්‍රශ්න පත්‍ර හයෙන් එක් ප්‍රශ්න පත්‍රයක් පමණක් අසමත් වූ විට අදාළ විෂය සඳහා සම්පූර්ණයෙන් පෙනී සිට සමත් විය යුතු ය. මුල් වරට පෙනී සිටින වර්ෂය ද ඇතුළත් ව අනුයාත වර්ෂ තුනක් තුළ විභාගය සම්පූර්ණ කළ යුතු ය.

**03. ප්‍රාචීන මධ්‍යම විභාගය හා ඊට අදාළ සංශෝධන**

ප්‍රධාන විෂයත්‍රයෙන් එක්වර සමත් විය හැකි ය. එක් විෂයක ප්‍රශ්න පත්‍ර තුනෙන් එක් ප්‍රශ්න පත්‍රයක් පමණක් අසමත් වුවහොත් අදාළ ප්‍රශ්න පත්‍රය පමණක් අසමත් ලෙස සැලකේ. එක් විෂයකින් එක් ප්‍රශ්න පත්‍රයකට වඩා අසමත් වුවහොත් අදාළ විෂය අසමත් ලෙස සැලකේ. එසේ අසමත් වන ප්‍රශ්න පත්‍රයෙන් හෝ ප්‍රශ්න පත්‍රවලින් සාමර්ථ්‍යය ලබා විභාගය සම්පූර්ණ කිරීම සඳහා මුල් වරට පෙනී සිටින වර්ෂය ද ඇතුළත් ව අනුයාත වර්ෂ පහක් ලැබේ.

**04. ප්‍රාචීන පණ්ඩිත අවසාන උපාධි පරීක්ෂණය හා ඊට අදාළ සංශෝධන**

ප්‍රධාන විෂයත්‍රයෙන් එක්වර සමත් විය හැකි ය. එක් විෂයක ප්‍රශ්න පත්‍ර හතරෙන් එක් ප්‍රශ්න පත්‍රයක් පමණක් අසමත් වුවහොත් අදාළ ප්‍රශ්න පත්‍රය පමණක් අසමත් ලෙස සැලකේ. එක් ප්‍රශ්න පත්‍රයකට වඩා අසමත් වුවහොත් අදාළ විෂය අසමත් ලෙස සැලකේ. එසේ අසමත් වන ප්‍රශ්න පත්‍රයෙන් හෝ ප්‍රශ්න පත්‍රවලින් සාමර්ථ්‍යය ලබා විභාගය සම්පූර්ණ කිරීම සඳහා මුල් වරට පෙනී සිටින වර්ෂය ද ඇතුළත් ව අනුයාත වර්ෂ හතක් ලැබේ. තව ද ප්‍රාචීන පණ්ඩිත අවසාන උපාධි පරීක්ෂණය සඳහා 2017 වසරට පෙර පැවැති විෂය නිර්දේශයෙන් පෙනී සිට එම පරීක්ෂණයෙන් අසමත් වූ අයට ද තමන් මුල් වරට පෙනී සිටි වර්ෂය ද ඇතුළත් ව අනුයාත වර්ෂ හතක් තුළ විභාගයට පෙනී සිට සාමර්ථ්‍යය ලබාගැනීමට ද අවස්ථාව සලසා දී ඇති බව ද වැඩි දුරටත් දන්වා සිටිමි.

අත් කළේ,
එන්. එච්. එම්. චිත්‍රානන්ද,
අධ්‍යාපන ලේකම්,
සභාපති, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම.

පූජ්‍ය බණ්ඩාරවෙල රතනසාර හිමි,
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාචීන),
ලේකම්, ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම.

පිටපත්

1. විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව - අ.ක.ස.
2. අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) - කා.දැ.ස.
3. සියලු ම සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් (පිරිවෙන්) - කා.දැ.ස.
4. සියලු ම පිරිවෙන් අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරීන් - කා.දැ.ස.


ගරු සභාපති: 0094-11-2784811
ஜனாதிபதி: 0094-11-2785162
The President: pr@oriental.lk

ගරු ලේකම්: 0094-11-2785047
செயலாளர்: 0094-11-2785047
The Secretary: sc@oriental.lk

පරිශීලක ගොනුව : பயனர் இடைமுகம் : User Interface: www.server.oriental.lk